# පුහු පශ්චාත්නූතනවාදයේ සිතීම

මිනිස් මනස යනු සංකීර්ණ ක්‍රියාවලියක් වෙයි. මනස යනුවෙන් ද්‍රව්‍යයක් ඇතැයි සිතිය නො හැකි ය. මනස ද්‍රව්‍යයේ විකාශය නිසා ඇති වී යැයි සිතීමට බටහිර විද්‍යාඥයෝ කැමතිවෙති. එහෙත් ඒ බව පෙන්වාදීමට ඔවුන්ට නො හැකි ය. මනස ද්‍රව්‍යයට ඌනනය කළහැකි නො වෙයි. එමෙන් ම බොහෝ බටහිර විද්‍යාඥයන් ඉතා මෑතක් වනතුරුම විශ්වාස කෙළේ මිනිසා හැරෙන්නට වෙනත් සතුන්ට මනසක් නොමැති බව ය. බටහිර විද්‍යාඥයන් අතර එතරම් වර්ධනයක් ලබානැති මනෝ විශ්ලේෂණයෙහි අනෙක් සතුන්ට මනසක් ඇති බව නො ගැනෙයි. බටහිර මනෝ විශ්ලේෂකයන් අද බටහිර සත්ත්ව විද්‍යාඥයන් සාමාන්‍යයෙන් කියන දේට සවන්දෙන්නේ නම් අනෙක් සතුන් ද සිතන බව දැනගන්නවාට සැකයක් නැත. එහෙත් ඊනියා පශ්චාත්නූතනවාදී මනෝ විශ්ලේෂකයන්ට ඒ සඳහා විවේකයක් නැත. ඔවුන් කටයුතුකරන්නේ ඊනියා පශ්චාත්නූතනත්වයක් ඇතැයි උපකල්පනය කරමින් ය. ඒ ඊනියා පශ්චාත්නූතනත්වයෙහි සත්තු නො සිතති. ළදරුවෝ නො සිතති. මොවුන්ගේ කසිකබල් විධික්‍රමයෙහි ප්‍රවාද නිරීක්ෂණ සමග සංගත වේ දැයි සොයා නො බැලෙයි.

එයට හේතුවක් වෙයි. බටහිර ස්වාභාවික විද්‍යාවන් යැයි ගැනෙන භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව ආදීන්හි මෙන් නොව බටහිර සමාජයීය විද්‍යාවන්හි ප්‍රවාද යන්න නිසි අයුරින් අවබෝධකරගනු ලැබූ සංකල්පයක් නො වෙයි. එහි ප්‍රවාද යනු නිරීක්ෂණ සමග සංගත විය යුතු ඒ සමග සැසඳිය යුතු දැනුමක් නො වෙයි. නිරීක්ෂණ සමග එකඟ නොවන ප්‍රවාද ප්‍රතික්ෂෙපකිරීමක් බටහිර සමාජයීය විද්‍යාවන්හි දක්නට නො ලැබෙයි. එබැවින් බටහිර සමාජයීය විද්‍යාවන්හි එකිනෙකට ප්‍රතිවිරුද්ධ වූ ද නිරීක්ෂණ සමග කිසිසේත්ම නොගැලපෙන්නා වූ ද ප්‍රවාද දැකිය හැකි ය.

කැලණිය විශ්වවිද්‍යාලයෙහි සේවයකරන ඊනියා පශ්චාත්මාක්ස්වාදිනියක් ඇය පශ්චාත්නූතනවාදිනියක වශයෙන් ලබාගත් අත්දැකීම් මත පදනම්වෙමින් කියාසිටියේ ළදරුවන් නොසිතන බව ප්‍රවාදයක් කියා ය. බටහිර සමාජයීය විද්‍යාඥයන් හා මෙරට සිටින ඔවුන්ගේ අනුකාරකයන් සිතන්නේ ප්‍රවාද යනු සෘෂි භාෂිත බව ය. ප්‍රවාද පරම සත්‍ය වේය යන හැඟීමක් ඔවුන්ට ඇත. ප්‍රවාදයක් යනු අප අත්දකින දෙයක් වෙනත් හේතුවක් හෝ හේතු මත පදනම් වී කෙරෙන විස්තරයක් පමණකි. එහෙත් මෙහි දී තේරුම්ගතයුතු ප්‍රධානම කරුණ වනුයේ අත්දැකීම ද යම් සංකල්ප හා ඇතැම්විට ප්‍රවාද ද මත පදනම්වන බවත් මේ සියල්ල අපේ නිර්මාන බවත් ය.

අපි උදාහරණයක් ලෙස නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ගනිමු. පොළොවට වස්තු වැටෙන්නේ පොළොව හා වස්තු අතර ඇති ගුරුත්වාකර්ෂණ බලය නමින් හැඳින්වෙන යම් බලයක් නිසා යැයි ඒ ප්‍රවාදයෙහි කියැවෙයි. මේ බලය ක්‍රියාත්මක වන්නේ කිනම් දිශාවකට ද, කිනම් විශාලත්වයකින් ද ආදිය ද ප්‍රවාදයෙහි විස්තර කෙරෙයි. මෙහි දී අපේ අත්දැකීම වනුයේ පොළොවට පොල් ආදී වස්තු වැටීම ය. මේ අප නිතර දකින සංසිද්ධියකි. එහෙත් ඒ සංසිද්ධිය පවා සංකල්ප කිහිපයක් මත පදනම් වෙයි. පොළොව, පොල්, උඩ - පහත, වැටීම, චලිතය ආදී සංකල්ප අපි එහි දී යොදාගන්නෙමු.

මේ සංකල්ප ද අපේ නිර්මාන වෙයි. පොළොව, පොළොවක් වන්නේ අප වැනි මිනිසුන්ට මිස දෙවියන්ට, බඹුන්ට හෝ සතුන් සිවුපාවුන්ට නො වෙයි. පොළොව යන සංකල්පය සමග ගෝලාකාර යන සංකල්පය ද අපට වෙයි. එහෙත් අවුරුදු පන්දහසකට පමණ පෙර විසූ මිනිසුන්ට පොළොව යනුවෙන් හැඟීමක් ඇතිවූයේ නම් එසේ වූයේ පැතලි යන සංකල්පයත් සමග ය. අවුරුදු පන්දහසකට පමණ පෙර ජීවත් වූ මිනිසුන්ගේ පොළොව හා අපේ පොළොව යනු එකක් ම නො වෙයි. එහෙත් අප බොහෝවිට සිතන්නේ පොළොව යන සංකල්පයෙන් කවුරුත් අදහස්කරන්නේ, අදහස්කෙළේ එකම වස්තුවක් බව ය.

මේ අතර තවත් අදහස් තිබෙයි. අපි පොළොවට මහී කාන්තාව යැයි කියමු. ඉංගිරිසියෙන් එවැනි සංකල්පයක් නැත. සිංහලයාගේ පොළොව හෙවත් පෘථිවිය හා ඉංගිරිසිකාරයාගේ අර්ත් (earth) යනු එකක් ම නොවන බව පැහැදිලි ය. එපමණක් නොව අවුරුදු පණහකට පමණ පෙර විසූ සිංහලයන්ගේ පොළොව හා වත්මන් සිංහලයන්ගේ පොළොව ද එකක් නො වෙයි. කෘෂිකාර්මික සමාජයක පොළොව යනු අප හිටගෙන සිටින යන එන බිමක් පමණක් නො වෙයි.

© Prof. Nalin De Silva

එකල සමාජයෙහි පොළොවට යම් ගෞරවයක් හිමිවිය. අද ඒ ගෞරවය දකින්නට නැත. අප කුඩාකල අපට උගන්වා තිබුණේ පොළොවෙහි ඉරටුවක් ඇනී තිබුණි නම් ඒ ගලවාදමන ලෙස ය. මහීකාන්තාව ඉරටුව ඇනීම නිසා යම් රිදීමකට භාජනයවන්නේ යැයි අපි සිතුවෙමු. එහෙත් අද සිංහල ළමුන්ට එවැනි හැඟීමක් ඇති නො වෙයි. ඔවුන්ට පොළොව යනු තවත් වස්තුවක් පමණකි. ඇතැම් සිංහලයන්ට පොළොව යනු විකුණන් කෑමට ඇති දෙයක් පමණකි. මේ සියල්ලෙන් පැහැදිලිවන්නේ පොළොව යන සංකල්පය එක් සමාජයකින් තවත් සමාජයකට වෙනස්වන්නේ කෙසේ ද යන්න ය.

සංකල්ප එසේ වෙනස්වන්නේ ඒ සංකල්ප මිනිසුන් විසින් නිර්මානයකෙරෙන බැවින් ය. පොළොව යනුවෙන් මිනිසුන්ගෙන් ස්වායත්ත වූ වස්තුවක් නොමැත. එක් එක් අයට ඇත්තේ ඒ ඒ තැනැත්තාගේ පොළොව ය. ඒ ඒ පොළොව ඒ ඒ අයගේ නිර්මාන වෙයි. සියළු සංකල්ප මිනිසුන්ගේ නිර්මාන වෙයි. ප්‍රවාදයකින් කෙරෙන්නේ එවැනි සංකල්පවලින් ප්‍රකාශවන අත්දැකීමක් විස්තරකිරීමකි. එසේ විස්තරකිරීමේදී බොහෝවිට තව තවත් සංකල්ප නිර්මානයකෙරෙයි. ගුරුත්වාකර්ෂණය යනු අප කලින් පෙන්වා දී ඇති අන්දමට නිව්ටන් පඬිවරයා විසින් කෙරුණු නිර්මානයකි. ගුරුත්වාකර්ෂණය යනුවෙන් දෙයක් නොමැති බව අයින්ස්ටයින් විද්වතා විසින් පෙන්වා දෙනු ලැබිණි. ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය නිව්ටන් පඬිවරයා විසින් නිර්මානයකරනු ලැබුයේ පොළොවට වස්තු වැටෙන්නේ ඇයි දැයි තේරුම්කර දීමට ය. එහි දී ඔහු කියා සිටියේ එයට හේතුව ගුරුත්වාකර්ෂණය බව ය.

ප්‍රවාද නිර්මානයකෙරෙන්නේ එලෙසින් අපේ වෙනත් නිර්මාන වූ අත්දැකීම් විස්තරකිරීම සඳහා ය. දැන් ළදරුවෝ නොසිතති යන නිගමනයට ලකාන් නමැති ඊනියා පශ්චාත්නූතනවාදී මනෝ විශ්ලේෂකයා එළඹෙන්නේ කෙසේ ද? ඊනියා පශ්චාත්නූතනවාදීන්ට ළදරුවෝ නොසිතති යන්න ම ප්‍රවාදයක් වෙයි. එහෙත් එය ප්‍රවාදයක් නොව නිගමනයක් බව ඔවුහු නො දනිති. සෑම ප්‍රවාදයකම නිගමන උපකල්පන ආදිය ඇත. ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයෙහි ගුරුත්වාකර්ෂණය යනුවෙන් දෙයක් ඇතැයි යන්න උපකල්පනයක් වෙයි. ඒ උපකල්පනය නිව්ටන් පඬිවරයාගේ නිර්මානයක් විය.

ළදරුවෝ නොසිතති යන නිගමනයට ලකාන් පඬිවරයා එළඹෙන්නේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය. ඔහු විසඳීමට බලාපොරොත්තු වූ ගැටළුව වූයේ මිනිසුන්ට මම යන අදහස, හැඟීම පහළවන්නේ කෙසේ ද යන්න ය. එය බටහිර සංස්කෘතියෙහි විසඳිය යුතුව තිබූ ගැටළුවකි. (සිංහල බෞද්ධයන්ට එය ගැටළුවක් නොවන්නේ ඒ පිළිබඳ පැහැදිලිකිරීම් ඇති බැවින් ය.) මේ ගැටළුව විසඳීමේ දී පළමුවෙන් ම නිරාකරණය කරගත යුතු ප්‍රශ්නය වූයේ මිනිසුන්ට මම යන සංකල්පය ඉතාම කුඩා ළදරු අවධියේ සිටම, මව්කුසෙන් බිහිවූ මොහොතේ සිටම, නැත්නම් මව්කුසෙහි පිළිසිඳගත් මොහොතේ සිටම ඇති වන්නක් ද, නොඑසේ නම් පසු අවස්ථාවක ඇති වන්නක් ද යන්න ය.

බටහිර ඊනියා පශ්චාත්නූතනවාදීන්ට අනුව මිනිසා යනු භාෂා නිර්මිතයක් වෙයි. එය ද ඔවුන්ගේ කසිකබල් ප්‍රවාදයක් වෙයි. ඒ මිනිසුන් හැසිරෙන්නේ කෙසේ ද යන්නට දෙන ලද පිළිතුරක කොටසක් ලෙස ඇතිවූ ප්‍රවාදයක් වෙයි. මිනිසා භාෂාව විසින් මෙහෙයවනු ලැබෙන බව ප්‍රවාදයෙන් කියැවෙයි. භාෂාව කාගේ නිර්මානයක් ද යන්න මේ පශ්චාත්නූතනවාදීන් යැයි කියාගන්නනන්නට කල්පනා නොවන්නේ ද? භාෂාව වෙනස්වන්නේ අවිඥානික ව යැයි මොවුහු සිතත් ද? මිනිසා භාෂා නිර්මිතයක් නම් භාෂාවෙන් ප්‍රකාශවන සංකල්ප හැරෙන්නට වෙනත් සංකල්ප මිනිසුන්ට තිබිය නො හැකි ය. එමෙන් ම භාෂාවක් දැනගැනීමට පෙර මිනිසුන්ට සංකල්ප ඇතිවීමට ද නො හැකි ය. එමෙන් ම ඊනියා පශ්චාත්නූතනවාදීන්ට අනුව මිනිසුන් සිතන්නේ ද භාෂාවක් ඔස්සේ ය. මිනිසා යනු භාෂා නිර්මිතයක් යැයි කීවිට මිනිසා සිතන්නේ ද භාෂාවක් උපයෝගී කරගනිමින් යැයි නිගමනයකිරීමට සිදුවෙයි.

මිනිසුන් භාෂාවක් පළමුවෙන් ම ඉගෙනගන්නේ ළදරුවියේ අවුරුද්දක් හමාරක් ගතවීමෙන් පසුව ය. එබැවින් ඉහත සඳහන් කරුණුවලින් කියැවෙන්නේ ඉතා කුඩා ළදරුවන් නොසිතන බවත්, ඔවුන්ට මම යනුවෙන් හැඟීමක්, අදහසක් නැති බවත් ය. එය ප්‍රවාදයක් නොව ප්‍රවාදයකින් ලැබෙන නිගමනයක් බවවත් මේ කසිකබල් පශ්චාත්නූතනවාදියෝ හා වාදිනියෝ නො දනිති. ලකාන් නම් පඬිවරයා පුහු ප්‍රවාද ගොඩනගන්නේ මේ නිගමන මත පදනම්වෙමින් ය. ඔහුගේ ප්‍රවාදයට අනුව ළදරුවෝ භාෂාවක් ඉගෙනගැනීමට පටන්ගැනීමෙන් පසුව යම්කිසි ආකාරයකට මම යන අදහස ඇතිකරගනිති.

© Prof. Nalin De Silva

මෙහි දී පැහැදිලි වියයුතු කරුණ නම් ළදරුවන් මම යන හැඟීම ඇතිකරගන්නේ යම් අවධියක දී භාෂාවක් ඉගෙනීමට පටන්ගැනීමට පසුව ය යන්න ලකාන් පඬිවරයාගේ ප්‍රවාදයක් නොවන බව ය. එය බටහිර කසිකබල් පශ්චාත්නූතනවාදී (පශ්චාත්ව්‍යුහවාදී) ප්‍රවාදයක් වන මිනිසා භාෂා නිර්මිතයක් ය යන්නෙන් ලැබෙන නිගමනයක් වෙයි. ලකාන් පඬිවරයා තම පුහු ප්‍රවාදයෙන් කරන්නේ ළදරුවන් එලෙස මම යන හැඟීම ඇතිකරගන්නේ කෙසේ ද යන්න පැහැදිළිකිරීමට ඊනියා අනෙකු ඔස්සේ තේරුමක් නැති උත්සාහයක් ගැනීම ය. එහෙත් මේ පුස්සන්ට (පුස්සන්නට, එනම් පුහු ප්‍රවාද ගොතන්නන්ට පඬිවරයා යන වචනය යෙදීම සුදුසු ද යන්න ප්‍රශ්නයක් වෙයි.) එය තේරුමක් නැති දෙයක් බව හෝ නො වැටහෙයි.

පුස්සන්ට හා පුස්සන් අනුකරනය කරන මෙරට පුහු පුස්සන්නට කෙසේ වෙතත් අපට මිනිසුන් පමණක් නොව සතුන් ද සිතන බවට දැනුමක් ඇත. එහි දී මනස යන්න ගැන සිංහල බෞද්ධයන් විසින් විවිධ අවස්ථාවල දී නිර්මානයකරනලද දැනුම් ද වෙයි. අපේ දැනුමෙහි මනස ප්‍රධාන කොට සැලකෙන අතර එය භෞතික පදාර්ථයකින් ව්‍යුත්පන්නකෙරෙන්නක් (ලබාගැනෙන්නක්) නො වෙයි. මිනිසා සහ පෘථිවියේ ජීවත්වන අනෙක් සතුන් සම්බන්ධයෙන් ගත්කල කිවහැකි වන්නේ මනසට පැවතිය හැක්කේ සිරුර ආශ්‍රයකරමින් බව ය. මනස ද්‍රව්‍යයක් නො වුණ ද මෙලොව ජීවත්වන මනස ඇති සතුන්ගේ මනස් ශරීරය ආශ්‍රය කරගනිමින් පවතියි. එහෙත් ඉන් කියැවෙන්නේ මනස් ඇති සියළු සත්ත්වයන්ගේ මනස් ඒ ඒ සතුන්ගේ සිරුරු ආශ්‍රිතව පවතින බව නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva